



කේ.ඒ.යෙහානි ඉමල්ෂා

# ඇය

- කර්තෘ :- කේ.ඒ.යෙහානි ඉමල්ෂා
- පොත් පිටකවර නිර්මාණය :- කේ.ඒ.සෙව්මිණි දිනෙත්මා (මහ/ශාන්ත අන්තෝනි බාලිකා විදුහල)
- පොත් පරිගණක සැකසුම :- කේ.ඒ.යෙහානි ඉමල්ෂා (මහ/මහාමායා බාලිකා විදුහල)
- කර්තෘගේ කෘති :- ඇය (පළමු දිගහැරීම)
- පාසල :- මහ/මහාමායා බාලිකා විදුහල
- ඉගෙනුම ලබන පංතිය :- 8A
- කෘතිය පළ කරන දිනය :- 08/02/2024
- ISBN අංකය :- 978-624-208-638-5

# පිදුම

***කුඩා කල සිට ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමට***

***උර දුන් මහාමායා නම් වූ දෙවනි මැණියන්ගේ***

***93වන සංවත්සරය වෙනුවෙන් පුදමි***

***මෙම පොත හරසරින් !***

***චිරං ජයතු මහාමායා!***

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථ කරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය ශශිකලා සේනාධිර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


1. අසාර්ථක වීම

2. උදව්ව

3. පළිගැනීම

4. වීරවරියගේ නික්ම යාම

5. ජය ගැනීම

# 1.අසාර්ථක වීම

"මොකද්ද මේ ලියලා තියෙන රිපෝර්ට් එක."කියමින් ප්‍රධාන සංස්කාරක ඇයගේ රිපෝර්ට් එක මේසයට විසි කළේ ය.ඇය රවා බලමින් මෙසේ කීවේ ය. "හරි සර්.මං හෙට වෙද්දි  ලියලා දෙන්නම්. මම මීට වඩා හොඳ රිපෝර්ට් එකක් ලියන්න උත්සාහ කරන්නම් සර්."

"මොකද මට රවන්නේ,ආ.. මුලින්ම කෙනෙක්ට ගරු කරන්න ඉගෙන ගන්න. විශේෂයෙන් ම තමන්ට වඩා ඉහළ තනතුරක් තියෙන කෙනෙක්ට."ප්‍රධාන සංස්කාරක කීවේ ය. "මම ඔයාට බය නෑ මිස්ටර් රාජ්

පතිරණ’’. ඇය සිතින් සිතුවා ය “හරි සර්. මං දැන් යන්නම්.” කියමින් ඇය ඔහුගේ කාර්යාලයෙන් පිටත් විය.

“මොනවද අනේ ඕකේ ඔච්චර වැරදි. මට නම් ඒක සුපිරි රිපෝට් එකක්.” ඇය සිතින් සිතුවා ය. ඇය ඇගේ වැඩ මේසයට ගොස් වාඩි වූවා ය. ඉන්පසු ඇය කල්පනාවක නිමග්න විය. ඉතින් මේ ඇය කවුද?

ඇය යනු ඉතා නිර්භීත අවුරුදු විස්සක තරුණියකි. ඇය නමින් ක්‍රිස්ටීන් ද සිල්වායි. සවස හතරට පමණ ඇය කාර්යාලයෙන් පිට වූයේ බැරෑරුම් සිතකින් ය. ඇය පාරේ ඇවිදිමින් සිතින් තර්ක කරන්නට වූවා ය.

“ක්‍රිස් මම දැන් මොකද කරන්නේ. අයියෝ..මම කාගෙන්ද උදව් ගන්න පුළුවන්? ම්ම්..කවුද අපේ කම්පැනි එකේ හොඳටම වැඩ දන්නේ. මිෂෙල් නේ,ඒත් එයා මාත් එක්ක තරහයිනේ.”

එසේ සිතමින් ඇය කම්මුල්වලට අතින් තට්ටු කළා ය. “හිතන්න, හිතන්න, හිතන්න හරිනේ මම ගූගල් එකෙන් සොයනවා.”ඇය සිතුවා ය. ඉන්පසු ඇය පාරේ ඇවිද ගියේ නැත.ඇය ගියේ නටමින්ය.

ක්‍රිස්ටීන් නිවස දුටු වහාම ධාවකයෙකු දිනුම් කණුව වෙතට දුවන්නාක් මෙන් නිවස දෙසට දිව්වා ය. ඇය බෑගය සෝෆාවට විසි කර ඇඟ පත සෝදා ගන්නට නාන කාමරයට ගියා ය. ඇය ඉක්මනින් ඇඟ සෝදා ගෙන පරිගණකය අසල වාඩි වූවා ය.

නිවසේ තනිව ම ජීවත් වන නිසා තමාත් සමග ම කතා කිරීමට ක්‍රිස්ටීන් පුරුදු වී සිටියා ය. “කෝ බලමු, ආ..රිපෝට් ලියන විදිය පුද්ගලික ව නිර්මාණය කරන්න ඕනෙ දෙයක්, ඒ නිසා කියන්න බැලු.” ක්‍රිස්ටීන් දුකින් කීවා ය.

# 2.උදව්ව

හදිසියේ ම ඇගේ නෙත් පවුලේ ඡායාරූපයක් අසල නතර විය.

"හරිනේ,අක්කා..." ක්‍රිස් කෑගැසුවා ය. ක්‍රිස්ටීන්ගේ අක්කා ඇය සේවය කරන නෝවා ආයතනයේ සභාපතිනියයි. ඇය කැතීනා ද සිල්වායි. "මෙහෙමයි මං අක්කත් එක්ක අවුරුදු ගානකින් කතා කරලා නෑ. පුදුම පඩි කමක් නේ තියෙන්නේ.

ආඩම්බර මොණරි. ඒ වුණත් දැන් මට තියන එකම විසඳුම අක්කා. හැබැයි එයා මට කතා කරයි ද දන්නේ නෑ.බලමුකෝ ඒත්" ක්‍රිස්ටීන් සිතුවා ය. ඇය තම සහෝදරියට දුරකථනයෙන් කතා කලා ය. "හෙලෝ අක්කේ. හෙලෝ..ආ ඇයි කතා කරේ?

අක්කේ.. මට උදව්වක් ඕනේ. ඔයාට මාව දැන්ද ඕන වුණේ?මොකක්ද ඕනෙ ඉක්මනට කියන්න. අක්කේ ඔයාට පුළුවන්ද මට මීම.."

"මං සාමාන්‍යයෙන් පහත් අයට උදව් කරන්නේ නෑ'' අක්කා කීවා ය.

ක්‍රිස්ටීන්ගේ සිතෙහි කෝපයක් සමඟ අසරණ බවක් මතු විය. “ඔයාට ඇත්තටම හිතක් පපුවක් නැද්ද අක්කේ, ඔයාට අම්මා අන්තිමට කිව්ව එකවත් මතක නෑ නේද? ආඩම්බර මොණරී”. ඇය එසේ දුරකථනය විසන්ධි කළා ය. “ඇත්තමයි මටයි ගහන්න ඕනේ එයාට කතා කරාට,

අක්කේ ඔයාට මං කිව්ව දේ කවදහරි තේරෙයි”. සිතින් සිතූ ඇය ඉදිරි පියවර ගැන කල්පනා කළා ය. “හරිනේ පුස්තකාලය.මට දැන් නේ මතක් වුණේ.” කියූ ක්‍රිස් පුස්තකාලයට පිය නැගුවා ය.

පුස්තකාලයට ගිය ඇය වාර්තාව ලිවීමට අදාළ පොත් කිහිපයක් තෝරා ගත්තා ය. ඇය එම පොත් අධ්‍යයනය කර වාර්තාව ලිවීම ආරම්භ කළා ය. වාර්තාව ලිවීමෙන් පසු ඇය කුලී රියක නැගී නිවසට ගියා ය.

# 3.පළිගැනීම

හෝරා ගත වී පසු දින උදා විය. “ට්‍රීං. ට්‍රීං” යැයි උදෑසන හතට ඔරලෝසුව නාද විය. ඒ හඬට අවදි වූ ක්‍රිස් ඉක්මනින් සූදානම් වී පෙරදා සකස් කල වාර්තාව ද රැගෙන නිවසින් පිට වූවා ය. ඇය බස් රථයක නැගී ආයතනයට ගියා ය.

ඇය ඉක්මනින් මිස්ටර් රාජ්ගේ කාර්යාලයට ගියා ය. “ආ..ඔයා ආවද? කෝ රිපෝට් එක” ඔහු රිපෝට් එක ඔහු රිපෝට් එක අතට ගනිමින් කීවේ ය. “ම්ම්..මේක ගොඩක් හොදයිනේ. වෙල් ඩන් ක්‍රිස්ටින් . ඔයා කොහොමද මෙච්චර ඉක්මනට ඉගෙන ගත්තේ?”

“සර් මම පුස්තකාලයෙන් තමයි ඉගෙන ගත්තේ.” ඇය කීවාය. “ආ.. කොහොම වුණත් මේක නියමයි” ඔහු කීවේ ය. හදිසියේ ම ඔවුන්ට කඟින ශබ්දයක් ඇසුණි. ඔවුන් පිටුපස හැරී බැලූ විට ඔවුන්ට දක්නට ලැබුණේ මිස් කැතීනාය.

“ආ, මේ ක්‍රිස්ටීන් නේ. මට ඇහුන විදියට ඔයා හොඳ රිපෝට් එකක් ලියලා වගේ. එහෙනම් තව පැයකින් විතර මගේ ඔෆිස් එකට එන්න. මම ඔයාට දෙන්න වැඩ ටිකක් තියෙනවා.” කියූ ඇය ක්‍රිස්ට නෝක්කාඩුවෙන් සිනා සී පිටව ගියාය.

“මම හිතන්නේ ඔයාට ප්‍රශ්නයක් එන්න වගේ යන්නේ. මිස් කැතීනාගේ හැටි ඔහොම මයි.” ඔහු කීවේය. ක්‍රිස් පැයකින් පමණ පසු මිස් කැතිනාගේ කාර්යාලයට ගියාය.

“ආ ක්‍රිස්ටීන් ඔයා ආවද? අතන තියෙන්නේ ඔයාට කරන්න තියෙන වැඩ.” කියමින් ඇය මේසය මත ඇති ෆයිල් ගොඩ දෙසට අත යොමු කලා ය. “මේ ටිකේ ගොඩක් වැරදි තියෙනවා ඒවා ඔක්කොම ටික හදලා අද හවසට ගෙනත් දෙන්න.” ඇය කීවා ය.

“මිස් කැතීනා ඔයා මගෙන් පළිගන්නද හදන්නේ? ” ක්‍රිස්ටීන් ඇසුවා ය. “වෙන්න පුළුවන්. මොකද මගේ චරිතය ගැන විවේචනය කරන්න කිසිම කෙනෙක්ට අයිතියක් නෑ. අනික මම ආඩම්බර වුණා කියන එක ලොකු ප්‍රශ්නයක් නෙමෙයි ක්‍රිස්ටින්. මොකද මම දැන් මේ නෝවා කම්පැනි එකේ වෙයාමන්.” කැතීනා කීවේ ය.

# 4.වීරවරියගේ නික්ම යාම

"අනික මට කිසිම කෙනෙක් පහත් කරන එක ප්‍රශ්නයක් නෙමෙයි. මොකද මේ හැමෝ ම මට වඩා පහත් නේ" ඇය කීවේ ය. අක්කා කවදාවත් හැදෙන කෙනෙක් නෙමෙයි සිතූ ක්‍රිස්ටීන් කිසිවක් නොකියා කාර්යාලයෙන් පිට වූවා ය.

''ඒ නෝංජලයාට මම හොද පාඩමක් උගන්වනවා. මම එයාට කියලා දෙන්නම් මට මොනවද කරන්න පුළුවන් කියලා.'' සිතූ කැතීනා තනිව ම සිනාසුණා ය. ''මං මේ කම්පැනි එකේ තවත් වැඩ කරොත් මම මැරිලා ඉදී.

මම මේ කම්පැනි එකෙන් අයින් වෙන්න ඕනේ.'' යැයි ක්‍රිස්ටීන් තමාගේ මේසය වෙතට යන අතරතුර සිතුවා ය. ඇය එම ෆයිල් ගොන්න මේසය මත තැබුවා ය. ''මම මේ කම්පැනි එකෙන් අයින් වුණොත් මොකද කරන්නේ?'' ඇය සිතුවා ය.

“මට පුළුවන් කම්පැනි එකක් පටන් ගන්න. ඔව් මගේ චූටි කාලේ ඉඳන් තිබ්බ ටාගට් එකනේ. මුල් කාලේ දී අමාරු වෙයි

හැබැයි මට ඒක කරන්න පුලුවන්.” සිතූ ඇය ඉල්ලා අස්වීමේ ලියුමක් සකස් කළා ය. ඇය එම ලියුම රැගෙන මිස් කැතීනාගේ කාර්යාලයට ගියා ය

“ආ ඔයා ආවේ වැඩ ටික අඩු කරලා දෙන්න කියන්නද නැත්නම් මගෙන් සමාව ගන්නද?” මිස් කැතීනා නෝක්කාඩුවෙන් ඇසුවා ය.“නෑ මං ආවේ මේක ඔයාට භාර දෙන්න.” කියමින් ඇය ලියුම භාරදී කාර්යාලයෙන් පිට වූවා ය.

මිස් කැතීනා එම ලියුම දෙස බලා මෙසේ සිතුවා ය.“ඔයා මගෙන් බේරෙන්න හිතනවනම් ඒක වැරදි” මෙසේ සිතූ ඇය රටේ සියලුම ආයතනවලට පණිවිඩයක් යැවුවා ය. එහි මෙසේ සඳහන් විය.

# 5.ජය ගැනීම

“මම අද දින ක්‍රිස්ටීන් ද සිල්වා නම් අයෙක් මගේ ආයතනයෙන් සොරකමක් සම්බන්ධයෙන් නෙරපනු ලැබුවා. ඇය ඔබගේ ආයතනයට ගැනීමේ දී සැලකිලිමත් වන්න

ඔයාට මට කරපු දේ ගැන කනගාටු වෙන්න පරක්කුයි. මම කිසිම දෙයක් ලේසියෙන් අමතක කරන කෙනෙක් නෙමෙයි.” කැතීනා තමාට ම කියා ගත්තා ය.

## අවුරුදු 2කට පසු

ලොවක් හදුනන ලොවක් අගය කරන ජේකා ආයතනය බිහි වී තිබුණි. එය නිර්මාණය කරන ලද්දේ වෙන කිසිවකු නොව ක්‍රිස්ටීන් ද සිල්වායි. බාධක කම්කටොලු හමුවේ නොනැසී තමාගේ උත්සාහයෙන් ඇය ජේකා ආයතනය ගොඩ නැංවිය.

දැන් ඇය ලොව විශාලතම ආයතනයක සභාපතිනියයි. එමෙන් ම ඇය ලොව ධනවත් ම කාන්තාවයි. මේ ඇගේ කතාවයි, මිස් ක්‍රිස්ටීන් ද සිල්වාගේ කතාවයි.

***ඉතින් ආදරණීය පාඨකයිනි කිසිම හේතුවක් මත උත්සාහය නොහරින්න.***

***TRY TRY TRY AGAIN, ONE DAY YOU CAN FLY AWAY.***

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනිම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන!

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,

සෙනෙවිරත්න මහලේකම්.